

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා කපු සංස්ථාව

ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය

යටතේ

ශ්‍රී ලංකා කපු සංස්ථාව සඳහා කපු පොහොර මිලදීගැනීම - 2026 වර්ෂය

ප්‍රසම්පාදන අංකය : SLCC/PRO/2026/105 – 2026-23

ලංසු ඉදිරිපත් කරනු ලබන ආයතනයේ නම :- .....

ආයතනයේ ලිපිනය :- .....

.....

දුරකථන අංක (ස්ථිර හා ජංගම) :- .....

විද්‍යුත් තැපැල් ලිපිනය :- .....

ලංසු ලේඛන සඳහා මුදල් ගෙවීම් කල දිනය :- .....

I වන කොටස

ලංසුකරුවන්ට උපදෙස් (අයි. ටී. බී.)

1. (අ) පොදු කරුණු		
1.1	**ලංසු තැබීම**	මෙහි II කොටසේ දත්ත පත්‍රිකාවේ පෙන්වා දී ඇති පරිදි, 2026 වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත අවශ්‍ය කජු පොහොර මිලදීගැනීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි පිළිගත් සැපයුම්කරුවන් මඟින් මුද්‍රා තබන ලද මිල ලංසු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.
2. (ආ) අන්තර්ගත ලේඛන		
2.1	**අන්තර්ගත ලේඛන**	**පහත දැක්වෙන ලේඛන අයත් වේ.**
		I. වන කොටස : ලංසු කරුවන්ට උපදෙස් **II.** වන කොටස : දත්ත පත්‍රිකාව **III.** වන කොටස : අවශ්‍යතා උපලේඛනය I හා II **IV.** වන කොටස : තාක්ෂණික පිරිවිතර හ පිරිවිතරවල අනුකූලතාව **V.** වන කොටස : මිල උපලේඛනය **VI.** වන කොටස : ලංසු ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය
3. (ඇ). මිල ලංසු සැකසීම		
3.1	**මිල ලංසු වලට ඇතුළත් වන ලේඛන**	මිල ලංසු වලට පහත දැක්වෙන ලේඛන ඇතුළත් විය යුතු වේ. (අ) . මිල ලංසු ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය හා මිල යෝජනා (ආ). අවශ්‍යතා උපලේඛනය I හා II (ඇ). මිල උපලේඛනය (ඈ). ලංසු සුරක්ෂණය (ඉ). රජයේ පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක්
3.2	**මිල ලංසු ඉදිරිපත් කිරීමේ ආකෘතිය හා මිල ලංසු ලේඛනය**	**ඉහත අංක 2 හි 2.1 යටතේ VI වන කොටසේ දැක්වෙන ආකෘති පත්‍රය යොදා ගෙන ලංසුකරුවන් විසින් මිල ලංසු ඉදිරිපත් කළ යුතු වේ.** ආකෘති පත්‍රයේ ස්වරූපය විකෘති වන ආකාරයේ වෙනස්කම් නොකළ යුතු වේ. විකල්ප ආකෘති පිළිගනු නොලැබේ. **<u>ලංසු ඉදිරිපත් කිරීම සඳහා කජු සංස්ථාව විසින් සපයනු ලබන ලංසු ලේඛන පමණක් භාවිතා කල යුතුය.</u>** ආකෘති පත්‍රයේ හිස්තැන් නොතිබෙනසේ ඉල්ලා ඇති විස්තර වලින් හිඩැස් පිරවිය යුතුවේ.
		සැපයුම්කාර ආයතනය අසාදු ලේඛන ගත වී නොතිබිය යුතුය.
		විකල්ප මිල යෝජනා සලකා බලනු නොලැබේ. මේ අනුව විකල්ප මිල යෝජනා ඉදිරිපත් නොකරන ලෙස සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. තරගකාරී මිල ලංසු ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිනු ලැබේ.
		දත්ත පත්‍රිකාවේ විශේෂ කොට දක්වා නැති අවස්ථාවල හැරෙන්නට අනික් සියළුම මිල යෝජනා ලංසු ලේඛනවල ඒ ඒ අයිතමයට වෙන් වෙන් වශයෙන් සඳහන් කල දිය යුතුවේ.
		මිල යෝජනාවේ සඳහන් මිල ලංසු සඳහා වට්ටම් ලබා දෙන්නේ නම්, ඒවාත් සමග මිල යෝජනා ඉදිරිපත් කෙරෙන ආකෘති පත්‍රයේ දැක්විය යුත්තේ මිල යෝජනාවේ මුළු ගණන ලෙස වේ.

		අදාල වන වැට බදු මුදල වෙනම පෙන්වා දිය යුතුවේ. ඔබ වැට බදු ලියාපදිංචි ආයතනයක් නම් අදාල වැට බදු ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් හෝ වැට බදු වලින් නිදහස් කරන ලද බවට ලේඛනයක් ලංසු ලේඛනය සමඟ ඉදිරිපත් කලයුතු වේ.
		ගැලපුම් කරගැනීමේ අදහසින් ඉදිරිපත් කර ඇති මිල යෝජනා නොදැක්වූ ප්‍රතිචාර ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3.3	**ලේඛණ සාක්ෂි**	**ඉහත අංක 2 හි 2.1 යටතේ IV වන කොටසේ තාක්ෂණික පිරිවිතර හා පිරිවිතර අනුකූලතා යන්නෙන් කියැවෙන තාක්ෂණික පිරිවිතර හා පිරිවිතර අනුකූලතා තමන් ඉදිරිපත් කරන පොහොරවල ඇත්දැයි තහවුරු කර ගැනීමට හැකිවන අයුරින් ලංසුකරු විසින් ලිඛිත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමක් මිල යෝජනාවේ අඩංගු කළයුතු වේ.** **මේ සඳහා අදාල අයිතමයට අදාලව ප්‍රතීතකරණය සහිත විද්‍යාගාරයක සහතික කරන ලද විද්‍යාගාර වාර්තාවක් ඉදිරිපත් කළයුතුවේ. සියලුම ලිඛිත සාක්ෂි, ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.**
3.4	**මුදල් වර්ගය**	ලංසුකරුවන් විසින් මිල ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල් වලින් පමණි.
3.5	**මිල ලංසුවල වලංගු කාලය**	**ලංසුකරුවන් වෙත ලංසු ඉදිරිපත් කිරීමට ලබාදී ඇති, අවසාන දිනෙන් පසු ඉදිරියට දින හැත්තෑ හතක (77) කාලයක් මිල ලංසු වලංගු විය යුතුය.**
4. (ඇ). මිල ලංසු ඉදිරිපත් කිරීම හා මිල ලංසු විවෘත කිරීම		
4.1	**මිල ලංසු ලේඛන ඉදිරිපත් කිරීම**	මිල ලංසු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නිල වෙබ් අඩවියෙන් (www.cashew.gov.lk) හෝ ශ්‍රී ලංකා කජු සංස්ථා ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් **2026.10.16 දින සිට 2026.10.29 වන දින ප.ව. 1.30 දක්වා ලංසු ලේඛන බාගත (Download) / ලබාගත හැකිය.** ලංසු ලේඛන ලබාගැනීමට **ආපසු නොගෙවනු ලබන රු: 3,500.00 ක (රුපියල් තුන්දහස් පන්සීයක් පමණි) තැන්පතුවක්** සංස්ථා ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා හෝ සංස්ථාවේ ලංකා බැංකුව කොල්ලුපිටිය II ශාඛාවේ අංක. 1633705 දරණ ගිණුම වෙත බැර කර, ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාල ලදුපතේ පිටපතක් මිල ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.
		මිල ලංසු ඉදිරිපත් කිරීමේදී ආපසු ගෙවනු ලබන රු: 162,800.00 ක (රුපියල් එක්ලක්ෂ හැට දෙදහස් අටසීයක් පමණි) ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය. ලංසු /යෝජනා වලංගු දිනෙන් ඔබ්බට දින විසි අටක් (28) දක්වා වලංගු විය යුතු අතර, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය. මුදල් තැන්පතුවක් මගින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කරන්නේ නම්, 2026.10.29 වන දින ප.ව. 1.30 ට ප්‍රථම ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සරප් වෙත මුදලින් ගෙවා හෝ සංස්ථාවේ ලංකා බැංකුව කොල්ලුපිටිය II ශාඛාවේ අංක. 1633705 දරණ ගිණුම වෙත බැර කර, මුදල් ගෙවූ බවට ඒ සඳහා වූ ලදුපතෙහි පිටපතක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. බැංකුව හරහා මුදල් තැන්පත් කිරීමේදී, " SLCC/PRO/2026/105 – 2026/23 – BS " යනුවෙන් අදාල ලදුපතෙහි මුද්‍රණය විය යුතුය.

		නිසිපරිදි සම්පූර්ණ කරන ලද **<u>ලංසු හා සාම්පල්</u> " මුල් පිටපත "** හා **" අනු පිටපත "** වශයෙන් පිළියෙල කර, **වම්පස ඉහළ කෙළවරේ උක්ත සඳහන් ප්‍රසම්පාදන නාමය හා අංකය සටහන් කර,** වෙන වෙනම කවර දෙකක බහා නැවත එම කවර දෙක මුද්‍රා තබන ලද තනි කවරයක බහා, **එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ <u>උක්ත සඳහන් ප්‍රසම්පාදන නාමය හා අංකය</u> සටහන් කර ඉදිරිපත් කළ යුතුය.**
		මිල යෝජනාව යතුරු ලේඛනය කිරීමෙන් හෝ නොමැකෙන තීන්තෙන් ලිවියයුතු අතර, ලංසුකරු හෝ ලංසුකරු විසින් බලය පවරා දෙනු ලැබුවකු විසින් අත්සන් කළයුතුවේ.
		උපදෙස් දී ඇති පරිදි මිල ලංසු ලේඛන මුද්‍රා තබා නොතැබීමෙන් හා සලකුණු නොයෙදීමෙන් වන අස්ථානගතවීම් හා බලාපොරොත්තු රහිත විවෘත කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව වගකියනු නොලැබේ.
		සම්පූර්ණ කරන ලද මිල ලංසු හා සාම්පල් **2026.10.29** වන දින **ප.ව. 2.00** හෝ ඊට **පෙර** ලැබෙන පරිදි, පහත ලිපිනයට ලියාපදිංචි / කුරියර් තැපෑලෙන් එවීමට හෝ සංස්ථා ප්‍රධාන කාර්යාලයේ තබා ඇති <u>**අංක - 01** ටෙන්ඩර් පෙට්ටියට</u> අතින් ගෙනවිත් බහාලිය හැකිය. **ප්‍රමාදවී ලැබෙන සහ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ**. **සභාපති,** **ප්‍රසම්පාදන කමිටුව,** **ශ්‍රී ලංකා කජු සංස්ථාව,** **තෙලවල පාර, රත්මලාන.**
4.2	**ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය**	**මිල ලංසු ඉදිරිපත් කිරීම 2026.10.29 වන දින ප.ව. 2.00 ට අවසන් වේ.**
		ප්‍රමාදවී ලැබෙන සහ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4.3	**මිල ලංසු විවෘත කිරීම.**	**ලංසු විවෘත කිරීම 2026.10.29 ප.ව. 2.05 ට රත්මලාන කජු සංස්ථා ප්‍රධාන කාර්යාලයේදී සිදුකරනු ලැබේ.** එම අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැක.
5. (ඉ). මිල ලංසු ඇගයීම හා සංසන්දනය කර බැලීම		
5.1	**පැහැදිලි කිරීම්**	මිල යෝජනා පරීක්ෂා කිරීමේදී, ඇගැයීමේදී හා සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව තම අභිමතය පරිදි තමන්ගේ මිල ලංසු පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස ලංසුකරුවෙකුගෙන් ඉල්ලා සිටිය හැකි වේ. ලංසු කරුවෙකු විසින් තම මිල ලංසු පිළිබඳව කරන පැහැදිලි කිරීම, එම මිල ලංසු සංශෝධනය කිරීම සඳහා හිමිවන අවස්ථාවක් නොවේ. එබදු ඉල්ලීම් කරනු ලැබුවද මුල් මිල ලංසු සංශෝධනය සඳහා සලකා නොබැලේ.
		පැහැදිලි කිරීම පිළිබඳ ඉල්ලීම හා ඊට දක්වන ප්‍රතිචාරය ලිඛිතව සිදුවිය යුතු වේ.

		ලැබී ඇති යෝජනාවල අන්තර්ගත කරුණු මත මිල යෝජනා ප්‍රතිචාරාත්මක ද නැද්ද යන්න ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරනු ඇත.
		මිල යෝජනාවක් ඇගැයීමට ලක්කිරීමෙන් පසු සාරානුකූලව ප්‍රතිචාරාත්මක නොවේ යයි හැඟී ගිය හොත් එබදු යෝජනා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ඇත.
		සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇතැයි තීරණය කරනු ලැබ ඇති මිල යෝජනා පමණක් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඇගැයීමට ලක් කෙරේ.
		මිල යෝජනාවක් ඇගැයීමේදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව පහත දැක්වෙන කරුණු සලකා බලයි. (අ) ඉදිරිපත් කර ඇති මිල ලංසු (ආ) ගණිතමය වැරදි, නිවැරදි කිරීම සඳහා මිල ගැලපීම් (ඇ) ලබා දෙන වට්ටම් සඳහා මිල ගැලපීම් (ඈ) නිසි පරිදි සම්පූර්ණ කර තිබීම හා අත්සන් යොදා තිබීම. (ඉ) ඉල්ලා ඇති අදාල ලිපි ලේඛන සියල්ල නිසි පරිදි සම්පූර්ණ කර අමුණා තිබීම. (ඊ) අවශ්‍යතා උපලේඛනවල සඳහන් නිර්ණායක සම්පූර්ණ කර තිබීම.
5.2	**කවර හෝ මිල යෝජනාවක් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ සියළුම යෝජනා ප්‍රතික්ෂේප කිරීම**	**මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.**
6. (ඊ). ලංසු ප්‍රදානය කිරීම		
6.1	**මිල යෝජනාවක් පිළිගැනීම.**	**ලංසු ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති පිරිවිතරයන්ට සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති, අවම මිල ලංසු ඉදිරිපත් කර ඇති ලංසුකරුවන්ගේ මිල යෝජනා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගනු ලබයි.**
		ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගන්නා ලද මිල ලංසු පිළිගත් බවට, ලංසුවල වලංගු කාලය ඉක්මයාමට පෙර ලංසුකරුට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ලිඛිතව දන්වනු ඇත.
		ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගන්නා ලද සැපයුම්කරු වෙත අදාල ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් අනතුරුව, සංස්ථාව විසින් ලබාදෙන ලද කාලසීමාව තුල II කොටසේ දක්ත පත්‍රිකාවේ සඳහන් පිරිවිතරයන්ට අනුකූලව පොහොර සැපයීම සිදුකල යුතුවේ.

6.2	**අත්තිකාරම් ගෙවීම**	**ලංසුකරුට අදාල ප්‍රසම්පාදන කාර්යය සඳහා අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටිය හැකිය. අත්තිකාරම් ලබාගැනීම සඳහා ලංසුකරු විසින් ලිඛිත ඉල්ලීමක් සිදුකල යුතු අතර, මුළු ලංසු වටිනාකමින් සියයට විස්සක (20%) උපරිමයක් අත්තිකාරම් වශයෙන් ලබාදෙනු ලැබේ. ඒ සඳහා ඉල්ලා සිටින මුදලට සමාන බැංකු ඇපකරයක්, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය. අවම වශයෙන් අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටින දිනයේ සිට දින අනූවක (90) කාලයක් සඳහා බැංකු ඇපකරය වලංගු විය යුතුවේ.**
7. (උ). ප්‍රසම්පාදන කාර්යය සිදුකිරීම		
7.1	**ප්‍රසම්පාදන කාලසීමාව**	ප්‍රසම්පාදන කමිටුව විසින් සැපයුම්කරු තෝරාගැනීමෙන් අනතුරුව ටෙන්ඩරය ප්‍රදානය කරන අවස්ථාවේදී භාණ්ඩ සැපයීම සිදුකලයුතු කාලසීමාව දැනුම්දීමට කටයුතු කරනු ඇත. එම කාලසීමාව තුල භාණ්ඩ ප්‍රවාහනය කර සැපයීම අවසන් කර, ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත භාරදිය යුතුය.

II කොටස

දත්ත පත්‍රිකාව

අයි ටී බී වගන්තියේ යොමුව

1.1

ආයතනය : ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව
ලිපිනය : තෙලවල පාර, රත්මලාන.

11.1

ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය :

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව,
තෙලවල පාර, රත්මලාන.

ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය හා වේලාව : 2026.10.29 ප.ව. 2.00

ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව : 2026.10.29 ප.ව. 2.05

11.2

<u>ප්‍රසම්පාදන නිර්ණායකයන් :</u>

1. ශ්‍රී ලංකා කෘෂි සංස්ථාවේ කෘෂි වතුයායන් සඳහා 2026 වර්ෂය වෙනුවෙන් අවශ්‍ය පහත සඳහන් කෘෂි පොහොර ප්‍රමාණයන් මිලදීගැනීම සඳහා පිළිගත් සැපයුම්කරුවන් මගින් මුද්‍රා තබන ලද මිල ලංසු කැඳවනු ලැබේ.

අයිතම අංකය	අයිතමය	ඉල්ලුම්කර ඇති ප්‍රමාණය	කිලෝ ග්‍රෑම් 50 බෑග් වලින්
01.	Urea	කි.ග්‍රෑ. 29400	588
02.	E.R.P.	කි.ග්‍රෑ. 34200	684
03.	M.O.P.	කි.ග්‍රෑ. 19200	384

2. **සැපයුම්කරු ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතුය.** (ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න)

3. **එක් එක් පොහොර අයිතමය සඳහා ප්‍රතීතකරණය සහිත විද්‍යාගාරයක සහතික කරන ලද විද්‍යාගාර වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.**

4. අදාල පොහොර තොග **කිලෝ ග්‍රෑම් 50 බෑග්** වලින් සැපයීම සිදුකල යුතුය.

5. කිලෝ ග්‍රෑම් 50 ඇසුරුමක් සඳහා වන මුදල **බදු රහිත සහ බදු සහිත** වශයෙන් වෙන වෙනම සඳහන් කර පෙන්වා දිය යුතුය.

6. ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු, අදාල සැපයිය යුතු පොහොර ප්‍රමාණය පහත සඳහන් ස්ථානයන් වෙත ප්‍රවාහනය කල යුතුය. **ඒ සඳහා වන වියදම මිල ලංසුවෙහි වෙනම සඳහන් කර දැක්විය යුතුය.**

පොහොර වර්ගය	සැපයිය යුතු ප්‍රමාණය	සැපයිය යුතු ස්ථානය
Urea	7850 kg (50kg ඇසුරුම් 157)	හාඩි කෘෂි වතුයාය, කිරාන්.
	9900 kg (50kg ඇසුරුම් 198)	පුත්තලම වතුයාය, පුත්තලම.
	5400 kg (50kg ඇසුරුම් 108)	එළුවන්කුලම වතුයාය, එළුවන්කුලම.
	6250 kg (50kg ඇසුරුම් 125)	කමන්දළුව වතුයාය, ආඩිගම.

පොහොර වර්ගය	සැපයිය යුතු ප්‍රමාණය	සැපයිය යුතු ස්ථානය
ERP	9000 kg (50kg ඇසුරුම් 180)	හාඩ් කජු වතුයාය, කිරාන්.
	11650 kg (50kg ඇසුරුම් 233)	පුත්තලම වතුයාය, පුත්තලම.
	6250 kg (50kg ඇසුරුම් 125)	එළුවන්කුලම වතුයාය, එළුවන්කුලම.
	7300 kg (50kg ඇසුරුම් 146)	කමන්දළුව වතුයාය, ආඩිගම.
ERP	3900 kg (50kg ඇසුරුම් 78)	හාඩ් කජු වතුයාය, කිරාන්.
	7350 kg (50kg ඇසුරුම් 147)	පුත්තලම වතුයාය, පුත්තලම.
	3600 kg (50kg ඇසුරුම් 72)	එළුවන්කුලම වතුයාය, එළුවන්කුලම.
	4350 kg (50kg ඇසුරුම් 87)	කමන්දළුව වතුයාය, ආඩිගම.

7. තවද ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු සංස්ථාව විසින් ලබාදෙන ලද කාලසීමාව තුල භාණ්ඩ ප්‍රවාහනය කර සැපයීමට සැපයුම්කරු අපොහොසත් වුවහොත්, එම ප්‍රමාදවන සෑම දිනයක් සඳහාම සැපයුම්කරු විසින් එක් එක් අයිතමයට අදාලව කි.ග්‍රෑ. 50 ඇසුරුමක් සඳහා ඉදිරිපත් කල ලංසු වටිනාකමින් සියයට එකක (01%) ප්‍රමාද ගාස්තුවක් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත ගෙවිය යුතු වේ.

8. සැපයුම්කරුවිසින් අදාල පොහොර තොග ප්‍රවාහනයේදී, පොහොර ඇසුරුම් සඳහා යම් හානි වීමක් හෝ අලාභයක් සිදුවුවහොත්, එම අලාභය සැපයුම්කරු විසින් දැරිය යුතු වේ.

<u>පිරිවිතරයන් :</u>

<u>(A) UREA (යූරියා)</u>

I. අවශ්‍ය ප්‍රමාණය :- කිලෝ ග්‍රෑම් 29400
II. නයිට්‍රජන් (N) ප්‍රතිශතය 46% ක් විය යුතුය.
III. කිලෝ ග්‍රෑම් 50 ඇසුරුම් 588 ක් වශයෙන් ලබාදිය යුතුය.
IV. සපයනු ලබන Urea සඳහා ප්‍රතීතකරණය සහිත විද්‍යාගාරයක සහතික කරන ලද විද්‍යාගාර වාර්තාවක් ඉදිරිපත් කලයුතුය.

<u>(B) E.R.P. (එප්පාවල රොක් පොස්පේට්)</u>

I. අවශ්‍ය ප්‍රමාණය :- කිලෝ ග්‍රෑම් 34200
II. පොස්ෆරස් පෙන්ටොක්සයිඩ් (P_2O_5) ප්‍රතිශතය 28% - 30% ක් විය යුතුය.
III. කිලෝ ග්‍රෑම් 50 ඇසුරුම් 684 ක් වශයෙන් ලබාදිය යුතුය.
IV. සපයනු ලබන ERP සඳහා ප්‍රතීතකරණය සහිත විද්‍යාගාරයක සහතික කරන ලද විද්‍යාගාර වාර්තාවක් ඉදිරිපත් කලයුතුය.

<u>(C) M.O.P. (මියුරියේට් ඔෆ් පොටෑෂ්)</u>

I. අවශ්‍ය ප්‍රමාණය :- කිලෝ ග්‍රෑම් 19200
II. පොටෑසියම් ඔක්සයිඩ් (K_2O) ප්‍රතිශතය 60% ක් විය යුතුය.
III. කිලෝ ග්‍රෑම් 50 ඇසුරුම් 384 ක් වශයෙන් ලබාදිය යුතුය.
IV. සපයනු ලබන MOP සඳහා ප්‍රතීතකරණය සහිත විද්‍යාගාරයක සහතික කරන ලද විද්‍යාගාර වාර්තාවක් ඉදිරිපත් කලයුතුය.

11.3	මේ සම්බන්ධයෙන් ලංසුකරුවන් සඳහා අවශ්‍ය වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා කජු සංස්ථාවේ **දුරකථන අංක : 011-2545741** මගින් ලබාගත හැකිය.

III කොටස

අවශ්‍යතා උපලේඛනය I

අනු අංකය	විස්තරය	විස්තර	උපදෙස්
01	රු. 162,800.00 ක ලංසු සුරක්ෂණය ගෙවීමට අදාල රිසිට්පත / බැංකු සුරක්ෂිතය අමුණා තිබීම.	ඔව්/ නැත	
02	රු. 162,800.00 ක ලංසු සුරක්ෂණය ගෙවීමට අදාල රිසිට්පත් අංකය*/ බැංකු සුරක්ෂිතයේ යොමු අංකය.		** සටහන් කරන්න*
03	ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරු තෝරාගත් පසු අනෙකුත් ලංසුකරුවන්ගේ ලංසු සුරක්ෂණය නිදහස් කල හැක. සාර්ථක ලංසුකරු කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු සුරක්ෂණය නිදහස් කල හැක.	එකඟ වේ / එකඟ නොවේ.	

අවශ්‍යතා උපලේඛනය II

අනු අංකය	විස්තරය	ඔව්/නැත/විස්තර	ඇමුණුම ඉදිරිපත් කර ඇත/නැත
01	රජයේ පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ආයතනයක් විය යුතුය. (ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න.)	ශ්‍රේණිය -	
02	පසුගිය වසර පහක (05) කාලසීමාවක රජයේ කොන්ත්‍රාත් සාර්ථකව සිදුකරන ලද බවට ලිපිලේඛන (තහවුරු කිරීමේ ලිපිලේඛණ ඉදිරිපත් කළ යුතුය)	ප්‍රමාණය -	
03	ආයතන ව්‍යුහය ආයතනයේ නම, ව්‍යාපාරය ලියාපදිංචි අංකය, ඒ සඳහා අදාල සහතික පත්‍ර, සේවක සංඛ්‍යාව ආදී අනෙකුත් තොරතුරු		
04	පසුගිය වසර පහක් (05) තුලදී රජයේ කොන්ත්‍රාත් සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ප්‍රමාණය		

IV වන කොටස

<u>තාක්ෂණික පිරිවිතර හා පිරිවිතරවල අනුකූලතාව</u>

01. රජයේ පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ආයතනයක් විය යුතු අතර, එය සනාථ කිරීම සඳහා අදාල ලේඛන ඇමිණිය යුතුය.

02. එක් එක් අයිතමයන්ට අදාල පොහොර තොග කිලෝ ග්‍රෑම් 50 බෑග් වලින් සැපයීම සිදුකල යුතුය.

03. එක් එක් පොහොර අයිතමය සඳහා ප්‍රතීතකරණය සහිත විද්‍යාගාරයක සහතික කරන ලද විද්‍යාගාර වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

04. ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු, අදාල සැපයිය යුතු පොහොර ප්‍රමාණය පහත සඳහන් ස්ථානයන් වෙත ප්‍රවාහනය කල යුතුය. ඒ සඳහා වන වියදම මිල ලංසුවෙහි වෙනම සඳහන් කර දැක්විය යුතුය.

පොහොර වර්ගය	සැපයිය යුතු ප්‍රමාණය	සැපයිය යුතු ස්ථානය
Urea	7850 kg (50kg ඇසුරුම් 157)	හාඩ් කජු වතුයාය, කිරාන්.
	9900 kg (50kg ඇසුරුම් 198)	පුත්තලම වතුයාය, පුත්තලම.
	5400 kg (50kg ඇසුරුම් 108)	එළුවන්කුලම වතුයාය, එළුවන්කුලම.
	6250 kg (50kg ඇසුරුම් 125)	කමන්දළුව වතුයාය, ආඩිගම.
ERP	9000 kg (50kg ඇසුරුම් 180)	හාඩ් කජු වතුයාය, කිරාන්.
	11650 kg (50kg ඇසුරුම් 233)	පුත්තලම වතුයාය, පුත්තලම.
	6250 kg (50kg ඇසුරුම් 125)	එළුවන්කුලම වතුයාය, එළුවන්කුලම.
	7300 kg (50kg ඇසුරුම් 146)	කමන්දළුව වතුයාය, ආඩිගම.
ERP	3900 kg (50kg ඇසුරුම් 78)	හාඩ් කජු වතුයාය, කිරාන්.
	7350 kg (50kg ඇසුරුම් 147)	පුත්තලම වතුයාය, පුත්තලම.
	3600 kg (50kg ඇසුරුම් 72)	එළුවන්කුලම වතුයාය, එළුවන්කුලම.
	4350 kg (50kg ඇසුරුම් 87)	කමන්දළුව වතුයාය, ආඩිගම.

05. සැපයුම්කරු විසින් සැපයියයුතු ඉහත සඳහන් පොහොරවල කල්ඉකුත්වීමේ කාලය, ඉදිරියට වසර දෙකක් (02) ක් විය යුතුය.

V වන කොටස

මිල උපලේඛණය

ලංසු සුරක්ෂණය (අදාළ මුදල සරප් වෙත ගෙව්වේ නම් හෝ බැංකු ගිණුම වෙත බැරකරන ලද නම්)

රු. 162,800.00 ලංසු සුරක්ෂණය ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත නොගැලවෙන ලෙස පහත කොටුවෙහි අලවන්න. **(එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබාගන්න.)**

රු. 162,800.00 ලංසු සුරක්ෂණය ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත ඉහතින් අලවා ඇත.

අත්සන : _____

මුල් පිටපත

VI වන කොටස

ශ්‍රී ලංකා කපු සංස්ථාව

කපු පොහොර මිලදීගැනීම - 2026 වර්ෂය

ප්‍රසම්පාදන අංකය : SLCC/PRO/2026/105 – 2026-23

මිල ලංසු ඉදිරිපත් කිරීම

ලැයිස්තු අංකය	පොහොර වර්ගය	ඉල්ලුම්කරන පොහොර ප්‍රමාණය (කි.ග්‍රෑ. 50 බෑග්)	කි.ග්‍රෑ. 50 බෑග් එකක වට්ටම් සහිත මිල (රු)		මුළු වටිනාකම (ප්‍රවාහනය රහිතව)		ප්‍රවාහන ගාස්තුව (රු)
			වැට් බදු සහිතව (රු)	වැට් බදු රහිතව (රු)	වැට් බදු සහිතව (රු)	වැට් බදු රහිතව (රු)	
01.	යුරියා	588					
02.	E.R.P.	684					
03.	M.O.P.	384					

ඉහත අනු අංක 01 සිට 03 දක්වා වැය වන මුළු මුදල,

සියලු බදු රහිතව (ප්‍රවාහනය රහිතව) (ඉලක්කමෙන්) : .....

සියලු බදු රහිතව (ප්‍රවාහනය රහිතව) (අකුරින්) : .....

සියලු බදු සහිතව (ප්‍රවාහනය රහිතව) (ඉලක්කමෙන්): .....

සියලු බදු සහිතව (ප්‍රවාහනය රහිතව) (අකුරින්) : .....

බව මෙයින් දන්වා සිටිමි.

(අ). අපි ලංසු තැබීමේ ලේඛන (අතිරේක අංක ඇතුළුව) පරීක්ෂා කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අපට කිසිදු ගැටලුවක් හෝ විරෝධතාවයක් නොමැත.
(ආ). ලංසු තැබීමේ ලේඛනවලට අනුකූලව සහ අවශ්‍යතා පිළිබඳ කාලසටහනෙහි (Schedule of Requirements) දක්වා ඇති බෙදාහැරීමේ කාලසටහන්වලට අනුව, ඉහත සඳහන් භාණ්ඩ සහ ඊට අදාළ සේවාවන් සැපයීමට අපි ඉදිරිපත් වන්නෙමු.
(ඇ). අපගේ ලංසුව, ITB උප-වගන්ති 11.1 ට අනුකූලව ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය ලෙස නියම කර ඇති දින සිට ITB උප-වගන්ති 8.1 හි දක්වා ඇති කාලසීමාව තුළ වලංගු විය යුතු අතර, එම කාලසීමාව අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක එය පිළිගනු ලැබිය හැකිය.
(ඈ). අපගේ ලංසුව පිළිගනු ලැබුවහොත්, ගිවිසුම නිසි ලෙස ඉටු කිරීම සඳහා ITB හි 43 වන වගන්තියට සහ CC හි 17 වන වගන්තියට අනුකූලව කාර්ය සාධන ඇපකරයක් ලබා ගැනීමට අපි එකඟ වෙමු;
(ඉ). ITB උප-වගන්ති 4.3 ට අනුකූලව අපට කිසිදු අවශ්‍යතා ගැටුමක් නොමැත.
(ඊ). අපගේ ආයතනය, එහි අනුබද්ධ හෝ අනුකාය ආයතන — ගිවිසුමේ යම් කොටසක් සඳහා වන උප කොන්ත්‍රාත්කරුවන් හෝ සැපයුම්කරුවන් ද ඇතුළුව — ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් අසාදු ලැයිස්තුගත කරනු ලැබ නොමැත.
(උ). විධිමත් ගිවිසුමක් සකස් කර අත්සන් තබන තෙක්, මෙම ලංසුව සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ ඔබගේ දැනුම්දීමට ඇතුළත් කර ඇති ඊට අදාළ ලිඛිත පිළිගැනීම අප අතර බැඳීම් සහගත ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක වන බව අපි වටහා ගනිමු.
(ඌ). ඇගයීමට ලක් කෙරුන අඩුම ලංසුව ඇති මිල යෝජනාව හෝ වෙනත් කිසියම් මිල යෝජනාවක් පිළිගැනීමට ඔබ බැඳී නැති බව අපි විශ්වාස කරමු.

ආයතනයේ නම : .....

ලිපිනය : .....

දුරකථන අංක (ස්ථිර / ජංගම) : .....

දිනය : ..... **.....**

අත්සන සහ නිල මුද්‍රාව

අනු පිටපත

VI වන කොටස

ශ්‍රී ලංකා කජු සංස්ථාව

කජු පොහොර මිලදීගැනීම - 2026 වර්ෂය

ප්‍රසම්පාදන අංකය : SLCC/PRO/2026/105 – 2026-23

මිල ලංසු ඉදිරිපත් කිරීම

අනු අංකය	පොහොර වර්ගය	ඉල්ලුම්කරන පොහොර ප්‍රමාණය (කි.ග්‍රෑ. 50 බෑග්)	කි.ග්‍රෑ. 50 බෑග් එකක වට්ටම් සහිත මිල (රු)		මුළු වටිනාකම (ප්‍රවාහනය රහිතව)		ප්‍රවාහන ගාස්තුව (රු)
			වැට් බදු සහිතව (රු)	වැට් බදු රහිතව (රු)	වැට් බදු සහිතව (රු)	වැට් බදු රහිතව (රු)	
01.	යුරියා	588					
02.	E.R.P.	684					
03.	M.O.P.	384					

ඉහත අනු අංක 01 සිට 03 දක්වා වැය වන මුළු මුදල,

සියලු බදු රහිතව (ප්‍රවාහනය රහිතව) (ඉලක්කමෙන්) : .....

සියලු බදු රහිතව (ප්‍රවාහනය රහිතව) (අකුරින්) : .....

සියලු බදු සහිතව (ප්‍රවාහනය රහිතව) (ඉලක්කමෙන්): .....

සියලු බදු සහිතව (ප්‍රවාහනය රහිතව) (අකුරින්) : .....

බව මෙයින් දන්වා සිටිමි.

(අ). අපි ලංසු තැබීමේ ලේඛන (අතිරේක අංක ඇතුළුව) පරීක්ෂා කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අපට කිසිදු ගැටලුවක් හෝ විරෝධතාවයක් නොමැත.
(ආ). ලංසු තැබීමේ ලේඛනවලට අනුකූලව සහ අවශ්‍යතා පිළිබඳ කාලසටහනෙහි (Schedule of Requirements) දක්වා ඇති බෙදාහැරීමේ කාලසටහන්වලට අනුව, ඉහත සඳහන් භාණ්ඩ සහ ඊට අදාළ සේවාවන් සැපයීමට අපි ඉදිරිපත් වන්නෙමු.
(ඇ). අපගේ ලංසුව, ITB උප-වගන්ති 11.1 ට අනුකූලව ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය ලෙස නියම කර ඇති දින සිට ITB උප-වගන්ති 8.1 හි දක්වා ඇති කාලසීමාව තුළ වලංගු විය යුතු අතර, එම කාලසීමාව අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක එය පිළිගනු ලැබිය හැකිය.
(ඈ). අපගේ ලංසුව පිළිගනු ලැබුවහොත්, ගිවිසුම නිසි ලෙස ඉටු කිරීම සඳහා ITB හි 43 වන වගන්තියට සහ CC හි 17 වන වගන්තියට අනුකූලව කාර්ය සාධන ඇපකරයක් ලබා ගැනීමට අපි එකඟ වෙමු;
(ඉ). ITB උප-වගන්ති 4.3 ට අනුකූලව අපට කිසිදු අවශ්‍යතා ගැටුමක් නොමැත.
(ඊ). අපගේ ආයතනය, එහි අනුබද්ධ හෝ අනුකාය ආයතන — ගිවිසුමේ යම් කොටසක් සඳහා වන උප කොන්ත්‍රාත්කරුවන් හෝ සැපයුම්කරුවන් ද ඇතුළුව — ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් අසාදු ලැයිස්තුගත කරනු ලැබ නොමැත.
(උ). විධිමත් ගිවිසුමක් සකස් කර අත්සන් තබන තෙක්, මෙම ලංසුව සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ ඔබගේ දැනුම්දීමට ඇතුළත් කර ඇති ඊට අදාළ ලිඛිත පිළිගැනීම අප අතර බැඳීම් සහගත ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක වන බව අපි වටහා ගනිමු.
(ඌ). ඇගයීමට ලක් කෙරුන අඩුම ලංසුව ඇති මිල යෝජනාව හෝ වෙනත් කිසියම් මිල යෝජනාවක් පිළිගැනීමට ඔබ බැඳී නැති බව අපි විශ්වාස කරමු.

ආයතනයේ නම : .....

ලිපිනය : .....

දුරකථන අංක (ස්ථිර / ජංගම) : .....

දිනය : ..... **.....**

අත්සන සහ නිල මුද්‍රාව